INTERNATIONAL TRUTH AND JUSTICE PROJECT

W ITJPSL.COM
E ITJPSL@GMAIL.COM

EXECUTIVE DIRECTOR:
YASMIN SOOKA

**2020 අගෝස්තු 30**

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ ජාත්‍යන්තර දිනය

**මාධ්‍ය නිවේදනය: අතුරුදහන් වූවන්ගේ නම් එක්රැස් කිරීම නිසා ලිංගික දූෂණයට හා වධබන්ධනයට ගොදුරු වීම**

**ජොහැන්නස්බර්ග්:** ශ්‍රී ලංකාවේ අතුරුදහන් කරනු ලැබුවන් පිළිබඳ සත්‍යය සොයා යාමට සම්බන්ධ වීම නිසා තරුණ දෙමළ ක්‍රියාධාරීන් පැහැරගැනීමට, වධහිංසනයට සහ ලිංගික දූෂණයට ගොදුරු වී තිබේ. බ්‍රිතාන්‍යයේ පමණක් අඩුම වශයෙන් එවැනි වින්දිතයන් පහළොස් දෙනකුට දේශපාලන රැකවරණ ලැබී ඇත.

*"යුද්ධය අවසන් වී දශකයකට වැඩි කලක් ගතව තිබියදීත්, යුද්ධයේදී සිය සොයුරු, සොයුරියන් අහිමිවූ බොහෝ දෙනකු ඇතුළු දෙමළ තරුණ, තරුණියන්ට සත්‍යය සොයා යාම නිසා දරුණු මිලක් ගෙවන්නට සිදු වී ඇත,"* යි සත්‍යය හා යුක්තිය සඳහා වන ජාත්‍යන්තර ව්‍යාපෘතියේ (ITJP) විධායක අධ්‍යක්ෂිකා යැස්මින් සූකා පැවසුවාය. *"තම ස්නේහවන්තයන්ට සිදුවූයේ කුමක්ද යන්න දැනගැනීමේ උවමනාවෙන් පෙළෙන අයට හිංසා කරමින් ඔවුන් පසුපස සුදු වෑන් යැවීම තව දුරටත් කළ නොහැකි බව අපි ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට මතක් කර දෙන්නෙමු."*

බ්‍රිතාන්‍යයේ රැකවරණ ලැබුන'වුන් කැපී පෙනුණු මානව හිමිකම් ක්‍රියාධාරීන් නොවේ. ඔවුහු නම් එක්රැස් කළ, විරෝධතා වලට උදව් කළ හෝ අතුරුදහන් වූවන්ගේ ඥතීන්ට පැමිණිලි ගොනු කිරීම සඳහා ආධාර උපකාර කළ තරුණ තරුණියන්ය. තමන් මුහුණ පා සිටින බරපතල අවදානම ගැන ඒ කිසිවකුටත් කිසිදු අදහසක් තිබී නැත. එක් අයකුට කියා තිබුනේ යෞවනයකු වන ඔහු ගැන යුද හමුදව උනන්දුවක් දක්වනු නැති බවයි. සිරකරගෙන සිටියදී ඔවුන්ට ආරක්ෂක අංශ අතින් විඳින්නට සිද්ධ වූයේ යටි පතුලට කස පහර දීම, ලිංගේන්ද්‍රිය තැළීම, සිගරට් වලින් පිළිස්සීම, ගිනියම් යකඩ පොල්ලෙන් හංවඩු ගැසීම, ජල හිංසනය, හුස්ම හිර කිරීම, පීඩාකාරී ඉරියව් වලින් එල්ලා තැබීම, බොරු ඝාතන සහ මරණ තර්ජන වලට අමතරව ලිංගික දූෂණය සහ කල්ලි දූෂණය වැනි කෲර වධබන්ධන වලටය.

*"මේ පවුල්වල අයිතියක් වන යුක්තිය ඉල්ලා බල කිරීමේදී ඔවුන් කිහිප වාරයක් වින්දිතයන් බවට පත් කොට තිබේ. එහි වගකීම මුළුමනින්ම ඇත්තේ සත්‍යය*

*හෙළි කරගැනීමට කිසිදු උවමනාවක් නැති රාජ්‍යය අතය,"* යි යැස්මින් සූකා පැවසුවාය.

අතුරුදහන් වූවන් පිළිබඳ ITJP සංවිධානයේ වෙබ් අඩවිය 2009 මැයි 18ද හෝ ඊට ආසන්න දිනවලදී රජයේ අත් අඩංගුවේ දී අතුරුදහන් වූ බවට චෝදනා කෙරෙන දෙමළ 340 කගේ නම් සහ ඡායාරූප අඩංගු කෝෂ්ඨාගාරයකි. ඔවුන් ශ්‍රී ලංකා යුද හමුදවට භාරවෙනු ඇසින් දුටු සාක්ෂිකරුවන් ගණනාවක් විදේශවල වෙසෙති.

පුදුම සහගත කාරණය වන්නේ දරුවන් 29 දෙනකුද ඇතුළුව අතුරුදහන් වූ සිය ගණනකට සිදුවුයේ කුමක්ද යන්න පිලිබඳ ඇති අවබෝධය ගැන ඔවුන් භාරවන අවස්ථාවේ එහි සිටි වර්තමාන හමුදපති ශවේන්ද්‍ර සිල්වා[1] ඇතුළු හමුද සෙන්පතියන්ගෙන් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය[2] හෝ එකම වතාවකවත් ප්‍රශ්න කර නැති වීමයි. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට 2018 මැයි මාසයේ ලිපියක් යවමින් ITJP කියා සිටියේ ඔවුන් විසින් විමර්ශනය කරනු ලබන පළමු සිද්ධිය මැයි 18 අතුරුදහන් වීම් විය යුතු අතර එහි මුල් පියවර විය යුත්තේ මැයි 18 භාරවීම් පුද්ගලිකවම නිරීක්ෂණය කළ බව ඇසින් දුටුවන් පවසන ශවේන්ද්‍ර සිල්වා සහ ජගත් ජයසූරිය[3] වැනි හමුද නිලධාරීන්ගෙන් ප්‍රශ්න කිරීම බවයි.

*"එක දවසක, එකම තැනක සිය ගණනක් ජනතාව[4] අතුරුදහන් වී දශකයකට වැඩි කාලයක් ගතවීත්, යුද හමුදවේ කිසිවකුගෙන් ප්‍රශ්න කර නැතිවීම විකාරයකි. ඒ වෙනුවට සිදුවී ඇත්තේ යුක්තිය ඉල්ලා සිටින'වුන් තව දුරටත් වින්දිතයන් බවට පත් කිරීම,"* යි යැස්මින් සූකා පැවසුවාය.

*"සංක්‍රාන්ති යුක්ති ක්‍රියාදමයක් ඇතිවෙතැයි සිතමින් යුක්තිය ඉල්ලා සිටි ඥතීන් වෙනුවෙන් ජාත්‍යන්තර ප්‍රජාවට සදචාරාත්මක වගකීමක් තිබේ. දේශපාලකයන් හා හමුද නිලධාරීන්ට අතට අත දීමට පෙළ ගැසෙමින් අලුත් ආණ්ඩුවට සහාය පල කරනු වෙනුවට, කොළඹ ඉන්නා තානාපති නිලධාරීන් කළ යුත්තේ අතුරුදහන් වූවන්ගේ ඥතීන් සහ ඔවුන්ගේ නිර්භීත නීතිඥයන් යෙදෙන සත්‍ය ගවේෂණය වෙනුවෙන් ඉදිරිපත් වී දිගටම සහාය පල කරනු පිණිස ඔවුන් සමග ඡායාරූප වලට පෙනී සිටීමය,"* ඇය වැඩි දුරටත් කියා සිටියාය.

වාර්තාවන පරිදි ජනමාධ්‍ය අමාත්‍ය කෙහෙළිය රඹුක්වැල්ල වින්දිතයන්ට මහත්සේ නිග්‍රහ කරමින් පිළිකුල් සහගත ලෙස පවසා ඇත්තේ[5] අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (OMP) ට ලැබුණු පැමිණිලිවල සඳහන් පුද්ගලයන් අතරින් භාගයක්ම සැබවින්ම පිටරට ජීවත් වන බවයි. OMP කාර්යාලය එක්සත් ජාතීන්ගේ සංවිධානයට වාර්තා කළේ පුද්ගලයන් 14,641 ක ලිපි ගොනු ඔවුන් සතුව ඇති අතර තවත් පැමිණිලි 129 ක්[6] අලුතින් ලැබුණු බවයි.

*"අතුරුදහන් වූවන්ගේ ඥතීන්ට අපහාස කරමින්, නිමක් නොපෙනෙන ඔවුන්ගේ සන්තාපයන් මහත් නිර්දය ලෙසින් හා අවඥවෙන් බැහැර කරන අභූත ප්‍රකාශ සම්බන්ධයෙන් ඇමැතිවරයා දැඩි ද්වේෂ දර්ශනයට ලක් කළ යුතුය. හත්දහසකට වැඩි ජනකායක් විදේශගත වී සිය දරුවන් හෝ මව්වරුන් හා සම්බන්ධ වන්නට තරම් කරදර නොවී සිටියේ කෙලෙසද? ඔවුන් ආගිය අතක් නොමැති බව වාර්තා කොට හුදෙක් බලධාරීන්ගේ සෝදිසි කිරීම් සහ අඩන්තේට්ටම් වලට ගොදුරු වීමෙන් ඥතීන් ලබන ලාබය කුමක්දැ,"* යි යැස්මින් සූකා ප්‍රශ්න කළාය.

---

[1] Designated in the USA: https://www.state.gov/public-designation-due-to-gross-violations-of-human-rights-of-shavendra-silva-of-sri-lanka-under-section-7031c-of-the-department-of-state-foreign-operations-and-related-programs-appropriations-a/
ITJP Dossier: http://www.itjpsl.com/reports/shavendra-silva
[2] 18 May 2018, ITJP Press release, https://itjpsl.com/assets/press/English-15-May-2018-Itjp-Press-release-Disappearance-Website-english.pdf
[3] Jagath Jayasuriya Latin America Case: https://itjpsl.com/reports/the-case-against-jagath-jayasuriya
[4] 12 Dec 2018, Joint Press Release with HRDAG, **New study estimates 500 Tamils disappeared in Army custody in Sri Lanka after surrendering at the end of the war in 2009.**
https://itjpsl.com/assets/press/12-December-2018-Press-release-with-HRDAG-copy.pdf
[5]http://www.tamilmirror.lk/%E0%AE%AA%E0%AE%BF%E0%AE%B0%E0%AE%9A%E0%AE%BF%E0%AE%A4%E0%AF%8D%E0%AE%A4-%E0%AE%9A%E0%AF%86%E0%AE%AF%E0%AF%8D%E0%AE%A4%E0%AE%BF/The-missing-persons-can-not-be-searched/150-254744
[6] A/HRC/42/40/Add.1, 10 Sep 2019.
[7] Half of 14641+129.

INTERNATIONAL
TRUTH
AND JUSTICE
PROJECT